ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
முதலீட்டு மேம்பாட்டு அமைச்சு
MINISTRY OF INVESTMENT PROMOTION

# 2023

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# කාර්යසාධන වාර්තාව - 2023

## ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

# ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

**වැය ශීර්ෂ අංකය- 187**

අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 – කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

# ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

2022.07.22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය, 2022.09.16 දිනැති අංක 2297/78 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා 2023.10.23 දිනැති අංක 2355/10 දරන අති විශේෂ ගැසට් පත්‍රවලට අනුව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත.

### 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

ශ්‍රී ලංකාව කලාපයේ වඩාත් තිරසර ආයෝජන ගමනාන්තය බවට පත් කිරීම.

### මෙහෙවර

අගය එකතු කළ අපනයන පදනමකට සහ තිරසර ආයෝජනය ආකර්ෂණය කර ගනිමින්, ගුණාත්මක සමාජ ආර්ථික සංවර්ධනයක් ශ්‍රී ලංකාව තුළ ඇති කිරීම.

### 1.3 ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආයෝජන ප්‍රවර්ධන විෂයයට සහ අමාත්‍යාංශය යටතේ ඇති විෂය පථයට අයත්වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදාගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. ශ්‍රී ලංකාව කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය.
5. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
6. ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය.
7. ජාතික යහපත සහ ආර්ථික දියුණුව අරමුණු කරගෙන විශේෂිත යටිතල සහ අනෙකුත් පහසුකම් සහිත ජාත්‍යන්තර ව්‍යාපාර හා සේවා කේන්ද්‍රස්ථානයක් වශයෙන් කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සංවර්ධනය කිරීම.
8. තාක්ෂණ උද්‍යාන ඇති කිරීම.
9. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු.

### 1.4 සංවිධාන සටහන

ඇමුණුම 01න් දක්වා ඇත.

### 1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
3. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව
4. කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය
5. තාක්ෂණ උද්‍යානය
6. තොරතුරු තාක්ෂණ උද්‍යාන
7. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
8. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
9. කන්තලේ සීනි සමාගම
10. උක් පර්යේෂණ ආයතනය

**02 පරිච්ඡේදය–ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක**

**<u>විශේෂ ජයග්‍රහණ</u>**

1. සෘජු විදේශ ආයෝජන සහ පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධන සඳහා ව්‍යාපාර හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම අරමුණුකොට ගෙන පවත්නා විධි විධාන සරල කිරීම හා කාර්යක්ෂම කිරීම, පිරිවැය හා කාලය අඩු කිරීම සහ විනිවිදභාවය වැඩි කිරීම යනාදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හත් දෙනෙකුගෙන් සමන්විත ආයෝජන පහසුකිරීමේ කමිටුවක් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ජනාධිපති ලේකම් විසින් පත්කර ඇත.මෙම කමිටුව විසින් ඊට අදාළ රේඛීය ආයතනවල සම්මත මෙහෙයුම් පටිපාටීන් ඇතුළත් කරමින් වාර්තාවක් සකස් කරන ලද අතර, එහි අවසාන වාර්තාව 2023.12.14 දින ගරු ජනාධිපතිතුමා වෙත පිරිනමන ලදී.

2. පිරිසැකසුම්කරණය හා ප්‍රති අපනයනය උදෙසා කරුංකා ආනයනය සඳහා වූ ව්‍යාපෘති යෝජනා තෝරා ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව,
   - ප්‍රති අපනයනය සඳහා කරුංකා පිරිසැකසුම් කර්මාන්තයට අදාළව ක්‍රියාපටිපාටියක් වැඩිදියුණු කර ඇත.
   - ආනයනය සඳහා කරුංකා පිරිසැකැස්ම හා ප්‍රති අපනයනයට අදාළව මූලික කටයුතු ආරම්භ කිරීමට හැකිවන පරිදි ව්‍යවසායයන් 15කට තාවකාලික අනුමැතිය ලබා දී ඇත.
   - ඉහත සඳහන් ව්‍යවසායයන් 15හි අවශ්‍ය නිර්නායක සපුරාලීම සඳහා පහසුකම් සලසමින් ඒ සඳහා “අනුමත ව්‍යවසාය” යන තත්ත්වය ලබා දීමට පියවර ගෙන ඇත.
   - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙතින් පිරිසැකසුම්කරණය හා ප්‍රතිඅපනයනය පිණිස අනුමත ආයෝජන ලිපි සමාගම් 09ක් සඳහා ලබා දී ඇත. කරුංකා ආනයනය, පිරිසැකසුම්කරණය අපනයනය සුමට ලෙස සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියා පටිපාටියේ දක්වා ඇති රාමුව තුළ මාර්ගෝපදේශයක් සකස් කර ඇත.

3. තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ (spent)ස්වරූපයෙන් ප්‍රතිඅපනයන කිරීමේ ක්‍රියාපටිපාටිය අදාළ ආයතන රැසක සහභාගීත්වයෙන් වැඩිදියුණු කර ඇත. අංක අමප/23/2380/631/032 හා 2024.02.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ (spent) ස්වරූපයෙන් ප්‍රතිඅපනයනයකිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා අනුමැතිය ලැබී ඇත.

4. මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව යටතේ පැවති කාලයේ සිටම විවිධ හේතුන් මත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ඉතිහාසය තුළ විගණකාධිපතිවරයාගෙන් පැහැදිලි විගණන මතයක් ලැබී

නොමැත. එබැවින්, 2022 වර්ෂයේ දී පැහැදිලි විගණන මතයක් (තත්ත්වාගණනය නොකරන ලද මතයක්) ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා සහ අමාත්‍යාංශය මැදිහත් වී කටයුතු කරන ලදී. ඒ අනුව 2023 වසරේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය නොකරන ලද මතයක් ලැබී ඇත.

5. කොළඹ වරාය නගරය ආකර්ෂණීය ආයෝජන හිතකාමී වෙළඳ නගරයක් ලෙස සංවර්ධනය කිරීම වෙනුවෙන් පහත නියෝග සකස් කොට සම්මත කර ඇත.

    - 2022 අංක 1 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ) නියෝග
    - 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම් පිළිබඳ මාර්ගෝපදේශ) නියෝග
    - 2023අංක 1 දරන කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන) නියෝග
    - 2023අංක 1 දරන කොළඹ වරාය නගරය (ව්‍යාපාර කටයුතුවල නිරතවන බලයලත් තැනැත්තන්) නියෝග

6. කොළඹ වරාය නගරයේ ඉඩම් කොටස් 07ක් මේ වන විටත් ආයෝජකයන් වෙත පිරිනමා ඇති අතර, ඒ ඒ ආයෝජකයන් හා ගිවිසුම්වලට එළඹ ඇත.

7. කොළඹ වරාය නගරය සංවර්ධනය කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් (NSC) ස්ථාපිත කිරීම සහ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 06 ක් සාර්ථකව පැවැත්වීම.

<u>අභියෝග</u>

1. ආයෝජකයන් ආයෝජනය සඳහා සුදුසු ස්ථාන තේරීමේ දී රට තුළ පවතින වරාය, ගුවන් තොටුපොළ, දුම්රිය මාර්ග ඇතුළු යටිතල පහසුකම්වල දියුණුව කලාපීය හා සමාන්තර රටවල් සමඟ සැසඳීමේ දී අඩු මට්ටමක පැවතීම.
2. ආයෝජන ව්‍යාපෘති සඳහා ක්ෂණිකව වෙන් කිරීමට සුදුසු යටිතල පහසුකම් සහිත පහසුවෙන් ලබාගත හැකි ඉඩම් නොමැතිකම.
3. රේඛීය ආයතනවලින් ආයෝජන ව්‍යාපෘති අනුමත කිරීම සඳහා ගතවන කාලය වැඩි වීම.
4. රාජ්‍ය සේවයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම, පවතින ආර්ථික වාතාවරණය අනුව සීමා කිරීමට ලක්ව ඇත. අතිරික්ත සේවක පිරිස් සහිත අනිකුත් රාජ්‍ය ආයතනවල වෘත්තීය සේවකයන් යොදවා පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සිදු කළ යුතු බවට ප්‍රතිපත්තිමය තීරණයක්රජය විසින් ලබා දී ඇත. එම තීරණය හේතුවෙන් කොළඹ වරාය නගරය ඉදිකිරීම් කටයුතු පරීක්ෂාවට ලක් කිරීමේ දී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉංජිනේරුමය වෘත්තීය අත්දැකීම් ඇති වෘත්තිකයන්ගේ හිඟතාවය නිසා සංවර්ධනකරු විසින් සිදුකරන මහා පරිමාණයේ ඉදිකිරීම් අධීක්ෂණය කිරීමේ දී අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වීම.

5. ශ්‍රී ලංකාව තුළ උපයෝගිතා පිරිවැය (විදුලිය) වැඩි වන අතර, එමඟින් නිශ්පාදන පිරිවැය ඉහළ යයි. එම නිසා නිශ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරීත්වය අඩු වේ.
6. ආර්ථික හේතූන් මත ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය සඳහා ගෝලීය ඉල්ලුම අඩුවීම.
7. කුසලතා සහිත ශ්‍රමිකයන් සංක්‍රමණය වීම.
8. කලාපීය රටවල් හා සැසඳීමේ දී කම්කරු පිරිවැය වැඩිවීම නිසා, නිෂ්පාදනය පිරිවැය වැඩිවීම.

<u>ඉදිරි ඉලක්ක</u>

1. නව ආයෝජන කලාප 07ක් ස්ථාපිත කිරීම (පරන්තන්, බිංගිරිය තුන්වන අදියර, මාන්කුලම්, කන්කසන්තුරය, කප්පල්තුරෙ‍රේ, හම්බන්තොට සහ ඉරණවිල ප්‍රදේශවල)
2. ආයෝජන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීම සඳහා රේඛීය ආයතන ද සම්බන්ධ කර ගනිමින් ස්වයංක්‍රීය පද්ධතියක් හඳුන්වා දීම.
3. පොරොන්දු වූ ස්ථාවර සෘජු ආයෝජන (Committed FDI) ඇ.ඩො.මිලි. 2,500 ලබා ගැනීම.
4. ඇ.ඩො.මිලි. 1,300ක ස්ථාවර සෘජු විදේශ ආයෝජන (Realized FDI) ලබා ගැනීම.
5. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමාගම් විසින් ඇ.ඩො.මිලි.8,850ක වෙළඳ භාණ්ඩ අපනයනය කිරීම.
6. කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කොළඹ මහ නගර සභාව (CMC) විසින් මළාපවහන පද්ධතිය ඉදි කිරීම.(දක්ෂිණ සම්බන්ධතාව)
7. 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා භාණ්ඩ අපනයනය ඇ.ඩො. බිලි. 13.1කින් ද, සේවාවන් ඇ.ඩො. බිලි. 3.6කින් ද වැඩි කිරීම.
8. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2024 වර්ෂයේ දී නව සෘජු හා වක්‍ර අපනයනකරුවන් 150ක් සංවර්ධනය කිරීම.
9. කොළඹ වරාය නගරයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා නව රෙගුලාසි 07ක් හඳුන්වා දීම.
10. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් 2023 වර්ෂයට සාපේක්ෂව සීනි නිශ්පාදනය 13%කින් වැඩි කිරීම (මෙට්‍රික් ටොන් 48,000ක් නිශ්පාදනය කිරීම)

ප්‍ර.ග.නි. / ග.නි/ ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතු ය.

.............................................................

එම්. එම්. නයිමුදීන්
ලේකම්
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
12 වන මහල, බටහිර කුලුන
ලෝක වෙළඳ මධ්‍යස්ථානය - කොළඹ 01

දිනය

6/6/2024..........................

# 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | තත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,242,552,086 | 101,925,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 20,044,485 | 250,254,885 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 9,571,441 | 12,862,238 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,272,168,013** | **365,042,123** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,272,168,013** | **365,042,123** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | 1,751,525 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඈ)-(ඇ)** | | **1,270,416,487** | **365,042,123** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 240.450.000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 218,480,180 | 43,522,326 | ඒසීඒ-2(ii) |
| 262,700.000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 121,517,884 | 72,388,040 | |
| 426.250.000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 311,737,526 | 462,078 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 929.400.000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **651,735,590** | **116,372,444** | |
| | **මූලධන වියදම්** | | | | |
| 25.900,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 8,671,813 | 901.913 | ඒසීඒ-2(ii) |
| 17.500.000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 13.501,645 | 3.632,510 | |
| 250,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 67,700,000 | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1.000.000 | හැකියා වර්ධනය | 14 | 788,000 | 198,499 | |
| 1.406.000.000 | වෙනත් මූලධන වියදම් | 15 | 1.168,965,534 | - | |
| **1,700,400,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **1,259,626,992** | **4,732,922** | |
| | තැන්පතු ගෙවීම් | | 19.712.748 | 250,897,053 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 3,797,189 | 31,143,964 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 23,509,937 | 282.041,017 | |
| 2,629.800,000 | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 1,934,872,518 | 403,146.383 | |
| (2,629,800,000) | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (664,456,031) | (38,104,260) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (664,456,031) | (38.104,260) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 45,500,748 | 55,068,804 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 12,507,474 | 18,281,726 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **58,008,221** | **73,350,530** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | - | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 11,905,226 | 18,011,216 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 45,500,748 | 55,068,804 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 602,248 | 270,510 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **58,008,221** | **73,350,530** |

පිටු අංක 7 සිට 37 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 38 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..................................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :එම්.එම්.නයිමුදීන්
තනතුර : ලේකම්
දිනය : 2024.02. 27

එම්. එම්. නයිමුදීන්
ලේකම්
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
12 වන මහල, බටහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය - කොළඹ 01

..................................
ප්‍රධාන ගණකාධිකාරි
නම : එම් ජී සී පුෂ්පකුමාරි
දිනය :2024.02. 13

එම්. ජී. සී. පුෂ්පකුමාරි
ප්‍රධාන ගණකාධිකාරි
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
12 වන මහල, බටහිර කුළුණ

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහ | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | 411,378 |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 3,300,612 | 2,259,331 |
| අග්‍රිම ලැබීම් | | 1,242,552,086 | 101,925,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 6,051,048 | 9,737,032 |
| තැන්පතු ලැබීම් | | 20,044,485 | 250,254.885 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **1,271,948,231** | **364,587,627** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 146,893,678 | 101,339,435 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 13,107,359 | 464,545 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 4,334,311 | 183,278 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 1,751,525 | - |
| අත්තිකාරම් ගෙවීම් | | 4,190,733 | 9,055,872 |
| තැන්පතු ගෙවීම් | | 19,712.748 | 250,897,053 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **189,990,355** | **361,940,185** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **1,081,957,876** | **2,647,442** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| මූලධන වියදම් | | 1,081,957.876 | 2.647.442 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **1,081,957,876** | **2,647,442** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | | **(1,081,957,876)** | **(2,647,442)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

**3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| - | - | - | - | - | - |

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 855,000 | 949,000 | 651,736 | 70.12 |
| ප්‍රාග්ධන | 1,370,000 | 1,700,400 | 1,259,627 | 74.08 |

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | - | - | - | - | - |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.) | 31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.) | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 45,500,747.50 | 45,500,747.50 | | 100 |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TIP/B/MOIP/FA/2023/05
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 මැයි 28 දින

ලේකම් කාර්යාලය
28 MAY 2024
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව හා සහතික කළ මූල්‍ය ප්‍රකාශනයේ දෙවන පිටපත (සිංහල,ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

ඩී. එල්.ඩී. ගුණතිලක
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TIP/B/MOIP/FA/2023/05 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 28 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

**ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 මතය

---

ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

අමාත්‍යාංශයේ නමින් වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් රු.665,000 මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. කෙසේ නමුත්, මෙම වියදම මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ මෘදුකාංග සංවර්ධනයක් ලෙස ගිණුම් ගත කිරීමකින් තොරව පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණු බැවින් මූල්‍ය නොවන වත්කම් රු. 665,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | සම්මත ණය ලේඛනය (සී. සී. 10) | සම්මත ණය ලේඛනයෙහි උපදෙස් | සම්මත ණය ලේඛනය (සී.සී 10), සම්මත ණය ලේඛනය පවත්වා ගෙන යා යුතු උපදෙස් අනුව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | ණය පාලන ගිණුම | සාමාජික ණය පාලන ගිණුම පවත්වාගෙන යාමේ උපදෙස් මාලාව | සාමාජික ණය පාලන ගිණුම පවත්වාගෙන යාමේ උපදෙස් මාලාවට අනුව ණය පාලන ගිණුම යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයන් 08 ක් වෙනුවෙන් සිදු කළ රු. 23,950,000 ක වියදම් සඳහා මුලික වියදම් ඇස්තමේන්තුවෙන් සියයට 16 සිට සියයට 95 දක්වා පරාසයක වියදම් සිදු නොකොට වෙනත් ව්‍යාපෘතිවල වැය විෂයන් වෙත මාරු කර තිබුණි.

(ආ) වැය විෂයන් 13 ක් වෙනුවෙන් සිදු කළ රු. 426,700,000 ක වියදම් සඳහා මුලික වියදම් ඇස්තමේන්තුවට අමතරව සියයට 33 සිට සියයට 6000 දක්වා පරිපූරක ඇස්තමේන්තු මගින් සහ මු.රෙ.66 මගින් ප්‍රතිපාදන සලසාගෙන ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි.

(ඇ) මූලික වියදම් ඇස්තමේන්තුවෙන් සිදු කල මුදල් ප්‍රතිපාදනයට අමතරව පරිපූරක ඇස්තමේන්තු මගින් සහ මු.රෙ. 66 මාරු කිරීම් මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද අවස්ථා 3 කදී රු.58,464,795 ක් ප්‍රමාණාත්මක ආකාරයෙන් වියදම් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයන් 01ක් සහ මූලධන වැය විෂයන් 03 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුවෙන් වෙන් කර දී තිබුණු එකතුව රු.2,750,000 ක ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. තවද, 187-2-4-5-1409 පුනරාවර්තන වැය විෂය සඳහා වෙන් කල රු.50,000,000ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර ඇත්තේ රු.129,245 ක් පමණි. මෙය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.2ක උපයෝජනයක් පමණි.

(ඉ) අමාත්‍යාංශයේ 2023 වර්ෂයට අදාළව සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,629,800,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ඉන් රු. 1,911,362,581ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.718,437,419ක් හෙවත් සියයට 27.3 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඊ) වැඩසටහන් දෙකෙහි එක් එක් ව්‍යාපෘතිවලට අදාළ පුනරාවර්තන වැය විෂයන් 27 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු. 587,050,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන්, මුදල් පොතට අනුව වියදම් ලෙස රු.40,945,551 හා වෙනත් ආයතන විසින් දරන ලද වියදම් ලෙස රු. 338,587,820 ක් අඩු කර මුළු වියදම ලෙස රු. 379,533,371 ක් උපයෝජනය කර තිබුණු හෙයින් ඉතිරිවීම්

රු.207,516,629 ක් වූ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 99ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් විය.

(උ) වැඩසටහන් දෙකෙහි එක් එක් ව්‍යාපෘතිවලට අදාළ මූලධන වැය විෂයන් 32 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු. 1,367,100,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන්, මුදල් පොතට අනුව වියදම් ලෙස රු. 764,651,183 හා වෙනත් ආයතන විසින් දරන ලද වියදම් ලෙස රු. 177,669,116 ක් අඩු කර මුළු වියදම ලෙස රු. 942,320,299 ක් උපයෝජනය කර තිබුණු හෙයින් ඉතිරිවීම් රු.424,779,701 ක් වූ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 99ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් විය.

(ඌ) අමාත්‍යාංශය විසින් උපයෝජනය කරන වාහන 15න් වාහන 6 ක් අමාත්‍ය කාර්යාලය වෙත අනුයුක්ත කර තිබෙන බවත් ඒ සඳහා රු. 3,979,339 ක් වාහන නඩත්තු වියදම් ලෙසද, රු.3,450,147 ක් මූලධන වියදම් ලෙසද, ඉන්ධන වියදම් ලෙස රු.10,029,939 ක් ද වශයෙන් රු.17,459,425 ක මුළු වියදමක් අමාත්‍යාංශය විසින් දරා තිබුණි. කෙසේ නමුත්, ඉතිරි වාහන 9 පරිහරණය කරනු ලබන අමාත්‍යාංශය සඳහා මුළු වියදම රු.12,827,807 ක් පමණක් වූ බැවින් වාහන සම්බන්ධයෙන් වූ වියදම් කළමනාකරණය නිසි පරිදි සිදු කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 | හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වුවද, අමාත්‍යාංශයේ වැඩසටහන් දෙකෙහි සමාලෝචිත වර්ෂයේ මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් මඟින් පුනරාවර්තන වැය විෂයන් 12 ක සහ මූලධන වැය විෂයන් 02 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනය සියයට සෘණ 47 සිට සියයට 128 දක්වා වූ පරාසයකින් වෙනස් කර තිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 225 | ගෙවීම් සඳහා අවශ්‍ය වවුචර් නියමිත ආකෘති පත්‍ර වල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතු වුවද අමාත්‍යාංශය නිසි ලෙස සම්පූර්ණ නොකල (අතිකාල කාල සීමාව, |

අතිකාල පැය ගණන, සම්පූර්ණ කල යුතු වැඩ සහ ඒකක පිලිබඳ විස්තර) අතිකාල දීමනා වවුචර් (පොදු 35අ) සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් සිදු කර තිබුණි.

| | | |
|---|---|---|
| (ඈ) | මුදල් රෙගුලාසි 881 | ඇප තැබිය යුතු තනතුරකට නිලධාරියෙකු පත්කිරීමේදී හෝ එවැනි තනතුරකට මාරු කිරීමේදී එකී නිලධාරියා විසින් එකී තනතුරකට පත්කළ දින සිට හෝ මාරු කළ දින සිට **දෙමසක්** ඇතුලත ඇප තැබීම කළ යුතු වුවද එවැනි තනතුරුවල සේවය කරන ඇප තැබිය යුතු නිලධාරීන් කවරෙක්ද යන්න හඳුනාගෙන තිබුණේ අමාත්‍යාංශය පිහිටුවීමෙන් මාස 10කට පසුවය. ඒසේ හඳුනාගත් නිලධාරීන් නවදෙනාගෙන් 7 දෙනෙකු 2024.05.03 දින වන විටත් සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර නොතිබුණි. |
| (ඈ) | මුදල් රෙගුලාසි 886 | ඇප තැබීමට හඳුනාගෙන තිබූ නිලධාරීන්ගෙන් 08 දෙනෙකුගේ ඇප බැඳුම්කර සකස් කර නොතිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි 891(1) | ඇප ලේඛනයේ අඩංගු විය යුතු සියලු කරුණු අඩංගුව සකස් කර නොතිබුණි. |
| (ඊ) | 1989 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/89 | මෙම චක්‍රලේඛයේ නියමයන්ට ප්‍රකාරව අතිකාල සඳහා වූ ලේඛණය සම්පූර්ණව යාවත්කාලීන අයුරින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

----------------

**3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

---------------------------------------------------

**(අ)** ප්‍රජාවගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරිම අරමුණු කරගෙන 2021 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ උද්‍යාන 2 ක්, යාපනය සහ මන්නාරම යන ප්‍රදේශවල, එවකට පැවති උතුරු නැගෙනහිර සංවර්ධන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීම සිදුවිය. කලින්කල විවිධ අමාත්‍යාංශ යටතේ පවත්වාගෙන ආ මෙම තාක්ෂණික උද්‍යාන 2022

ජූලි 22 දිනැති අති විශේෂ ගැසට්පත්‍ර අංක 2289/43 ප්‍රකාරව එදින සිට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතට පැවරීම සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

I. තොරතුරු තාක්ෂණ උද්‍යාන පිහිටුවීමේදී 2001 ඔක්තෝම්බර් 29 දිනැති අංක 27/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ නිත්‍ය කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීම සිදුවී තිබුණි. මීට අමතරව තාවකාලික/කොන්ත්‍රාත් සහ අනියම් පදනමින්ද සේවකයන් බඳවාගැනීම සිදුකර තිබුණි. කෙසේ වෙතත් එම සේවකයන්ගෙන් බහුතරය විගණිත දිනය වන විට සේවයෙන් ඉවත් වී තිබූ අතර 47 දෙනෙකු සේවය කළ යුතු යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය සේවකයන් 07 දෙනෙකුටද , සේවකයන් 12 දෙනෙකු සිටිය යුතු මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය සේවකයන් 06 දෙනෙකුටද සීමා වී තිබුණි. මින් උද්‍යාන දෙකටම ස්ථිර පදනමින් සිටිනුයේ එක් සේවකයෙකු පමණක් වන අතර සෙසු සියලු සේවකයින් අනියම් සහ කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් පිරිස වේ. තවද, විගණිත දිනය වන විටත් තොරතුරු තාක්ෂණ උද්‍යානවල කාර්ය මණ්ඩල තනතුරු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හෝ රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර බඳවා ගැනීමේ පටිපාටිය මෙන්ම වැටුප් පරිමාණද සකස් කර නොතිබුණි.

II. යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2023 වර්ෂය සඳහා සකස්කළ සැලැසුම් අනුව සිසුන් 320 ක් වෙනුවෙන් සහතිකපත්‍ර පාඨමාලා වර්ග 6 ක්ද ඩිප්ලෝමා පාඨමාලා වර්ග 5 ක්ද මාර්ගගත වැඩමුළු 02 ක්ද අන්තර්ජාල තාක්ෂණය පිළිබඳ විශේෂ වැඩමුළුවක්ද වශයෙන් සැලසුම් සකස් කර තිබුණද, 2023 වර්ෂයේදී එක් සහතිකපත්‍ර පාඨමාලාවකට සිසුන් 16 ක්ද, එක් ඩිප්ලෝමා පාඨමාලාවකට සිසුන් 11 ක්ද එක් වැඩමුලුවකට සිසුන් 16 ක්ද වශයෙන් මුළු සිසුන් 43 දෙනෙකු, එනම් සැලසුම් කළ සිසුන් ප්‍රමාණයෙන් සියයට 13 ක ඉතා අඩු මට්ටමක සිසුන් ලියාපදිංචිය පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ පාඨමාලා ගාස්තු සහ ලියාපදිංචි කර ගැනීමට අපේක්ෂා කළ සිසුන් ප්‍රමාණය අනුව රු.1,129,000 ක පමණ ආදායමක් පාඨමාලා ගාස්තු ලෙස රජයට අයකර ගැනීමට හැකියාව තිබුණද, අපේක්ෂිත සිසුන් ප්‍රමාණය බඳවා ගැනීමට නොහැකිවීම තුළ 2023 වර්ෂයේදී රාජ්‍ය ආදායම ලෙස අය කරගත හැකිව තිබුණේ රු. 131,080 ක් වන අතර එය සැලසුම්ගත ආදායමින් සියයට 12ක් පමණි.

(iii) 2023 සැප්තැම්බර් 21 දිනැති අංක JF/ADM/ITPARK/9/6/2022 දරන ලිපිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් විසින්, ඒ වන විට ස්ථිර කාර්ය මණ්ඩලය තුළ කිසිදු ආචාර්යවරයෙකු නොසිටින බැවින් සුදුසුකම්ලත් ස්ථිර ආචාර්ය මඬුල්ලකගේ කඩිනම් අවශ්‍යතාවය, පෞද්ගලික අංශය සතු ගොඩනැගිල්ලක කුලී පදනම මත මෙම තොරතුරු තාක්ෂණ උද්‍යානය පවත්වා ගෙන යාම සහ මේ හේතුවෙන් රජයේ ගොඩනැගිල්ලක අවශ්‍යතාවය , නව පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමට සහ අලුත්වැඩියා කිරීමට ප්‍රාග්ධන වෙන්කිරීම් සිදු නොවීම සහ පුනරාවර්තන වියදම් පමණක් අමාත්‍යාංශයෙන් ලැබීම යනාදිය පිළිබඳව අදහස් දක්වමින් යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයේ කාර්යභාර නිලධාරි විසින් සකසා තිබූ කාර්යසාධන වාර්තාව සමඟ අමාත්‍යාංශ ලේකම් වෙත එවන ලද ලිපිය සම්බන්ධව අමාත්‍යාංශය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(iv) සිසුන් ලියාපදිංචිය ක්‍රමිකව අඩුවීම මගහරවා ගැනීම පිළිබඳව උක්ත (iii) හි සඳහන් ලිපිය මගින් දක්වා ඇති යෝජනා වන තවදුරටත් විධිමත් කරන ලද පාඨමාලා හඳුන්වාදීම, රැකියා ඉලක්කගත පාඨමාලා හඳුන්වා දීම, පාඨමාලා පිළිබඳව වරින්වර ප්‍රචාරණයන් සිදුකිරීම යනාදී දෑ සම්බන්ධව අමාත්‍යාංශය විසින් පියවර ගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය. තවද පසුගිය වර්ෂ කිහිපය තුළ සිසුන්ගේ ලියාපදිංචිය සීඝ්‍රයෙන් අඩුවීම සිදුවී තිබූ අතර ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව |
|---|---|
| 2016 | 81 |
| 2017 | 201 |
| 2018 | 240 |
| 2019 | 336 |
| 2020 | 126 |
| 2021 | 57 |
| 2022 | 27 |
| 2023 | 43 |

(v) තොරතුරු තාක්ෂණ උද්‍යානය විසින් අනිවාර්යයෙන් මාසිකව අමාත්‍යාංශය වෙත එවිය යුතු මාසික වියදම් ප්‍රකාශන (Monthly Expenditure Statement) ක්‍රමවත්ව යොමු කර නොතිබුණු අතර ඒ පිළිබඳව නිසි අධීක්ෂණයක් නොතිබුණි.

(vi) මෙමු තොරතුරු තාක්ෂණ උද්‍යාන පිහිටුවීමේ අරමුණු වූයේ ප්‍රජාව අතර මූලික පරිගණක දැනුම පුළුල් කිරීම, අඩු පිරිවැයක් යටතේ අන්තර්ජාල පහසුකම් ලබාදීම තුළින් තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය, ප්‍රදේශයේ දිළිඳු පවුල්වල දරුවන්හට පරිගණක පුහුණුව නොමිලේ ලබාදීම යනාදිය වේ. කෙසේවුවද, එලෙස දිළිඳු පවුල්වල දරුවන්හට පරිගණක පුහුණුව නොමිලේ ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී තෝරාගත් සිසුන් කවුරුන්ද යන්න පිළිබඳව සහ එම ක්‍රියාවලිය අමාත්‍යාංශය මඟින් අධීක්ෂණය වී නොතිබුණි.

(vii) විගණිත දිනය වන විට තොරතුරු තාක්ෂණ උද්‍යානය තුළ සහකාර අධ්‍යක්ෂ, පාඨමාලා කළමනාකරු, ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී, ආචාර්ය තනතුරු සියල්ලමද, සුපරීක්ෂක, තාක්ෂණ නිලධාරී තනතුරු 02 ක්, සහකාර තාක්ෂණ නිලධාරී, උපදේශක තනතුරු 10 ක්, මෙහෙයුම් ක්‍රියාකරු තනතුරු 04 ක්, පුස්තකාලාධිපති, ලිපිකරු තනතුරු 02ක්,කාර්යාල සහායක, කම්කරු තනතුරු 02ක්, ආරක්ෂක නිලධාරී තනතුරු 04 ක්, කාන්තා ආරක්ෂක නිලධාරී, ජෙනරේටර් ක්‍රියාකරු/විදුලි කාර්මික තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි. තවද,තොරතුරු තාක්ෂණ උද්‍යානයේ ප්‍රධාන තනතුර වන විධායක නිලධාරී/ අධ්‍යක්ෂ තනතුර විගණිත දිනය වන විට දරනුයේ සංවර්ධන නිලධාරී සේවයේ දෙවන ශ්‍රේණියේ නිලධාරියෙකු විසිනි.

III. මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය සඳහා 2023 වර්ෂයට අදාළව පාඨමාලා 10 ක් සඳහා සිසුන් 300 දෙනෙකු බඳවාගැනීමට සැලසුම් කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට පාඨමාලා 3 ක් සඳහා සිසුන් 155 දෙනෙකු පමණක් ලියාපදංචි වී තිබූ අතර එය 52%ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ පාඨමාලා ගාස්තු සහ ලියාපදිංචි කර ගැනීමට අපේක්ෂා කළ සිසුන් ප්‍රමාණය අනුව පාඨමාලා වලින් රු. 2,185,000 ක් ආදායම් ලෙස උපයා ගැනීමට සැලසුම් සකස් කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට තත්‍ය ලෙස උපයා ගෙන තිබූයේ රු. 833,500 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 38 ක් පමණි.

(iii) තොරතුරු තාක්ෂණ උද්‍යානය විසින් අනිවාර්යයෙන් මාසිකව අමාත්‍යාංශය වෙත එවිය යුතු මාසික වියදම් ප්‍රකාශන (Monthly Expenditure Statement) සහ මාසික

ආදායම් ප්‍රකාශන ක්‍රමවත්ව යොමු කර නොතිබුණු අතර ඒ පිළිබඳව නිසි අධීක්ෂණයක් නොතිබුණි.

(iv) තොරතුරු තාක්ෂණ උද්‍යානය තුළ විගණිත දිනය වන විට ආචාර්ය තනතුරු සියල්ල, උපදේශක තනතුරක්, තාක්ෂණ නිලධාරි තනතුර සහ ආරක්ෂක නිලධාරි තනතුර පුරප්පාඩුව පැවතුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

(අ) අමාත්‍යාංශය වෙත වෙනත් ආයතන වෙතින් ලබා දී තිබුණු වාහන 16 න් එක් වාහනයක් ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත වෙතින් තාවකාලික පදනම මත ලබා දී තිබුණද එය අමාත්‍යාංශය වෙත පවරා දිය නොහැකි බව දන්වා තිබුණු අතර එය 2023 දෙසැම්බර් 31 දින වන විටත් එය අමාත්‍යාංශය විසින් උපයෝජන කරමින් පැවතුණි. තවද ඉතිරි වාහන 15 න් 14 ක් විවිධ අමාත්‍යාංශ විසින් තාවකාලික පදනම මත මෙම අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු අතර එම වාහන අමාත්‍යාංශ වෙත පවරා ගැනීමකින් තොරව සහ ලියාපදිංචි අයිතිය නොමැතිව විගණන දින වන විටත් අමාත්‍යාංශය විසින් උපයෝජනය කරමින් පැවතුණි.

(ආ) ඉතිරි වාහනය ධාවනය වන තත්ත්වයේ නොපවතින බවට තොරතුරු දක්වා තිබුණද එම වාහනය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමක් සිදු කර නොතිබුණ අතර එය ලබා දුන් අමාත්‍යාංශය වෙත නැවත ලබා දීමක් ද සිදු කර නොතිබුණි. ඒ අනුව එය නිසි පරිදි බැහැර කිරීමට අපොහොසත් වී තිබුණි.තවද මෙම වාහනයේ අළුත්වැඩියා වියදම් සහ සේවා කිරීමේ ගාස්තු වෙනුවෙන් 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් රු. 603,640 ක මුදලක් ද වැය කර තිබුණි.

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(අ) දිනෙන් දින ඉහළ යන ඉඩම් ඉල්ලුමට සරිලන පරිදි කොළඹ නගරය පුළුල් කිරීම සඳහා කොළඹ වරායට යාබද ඉඩම් ගොඩකිරීමේ යෝජනාවක් වශයෙන් කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී .මෙම ව්‍යාපෘතියේ දී උපයෝගිතා සම්බන්ධ කිරීම සඳහා තරංග ආරක්ෂණ දියකඩනය, ඉඩම් ගොඩකිරීම, පොළව වැඩිදියුණු කිරීම, ගොඩකිරීම්, ඇළ මාර්ග ඉදිකිරීම සහ ගොඩකරන ලද ඉඩම් අනාගත ගැනුම්කරුවන්ට පැවරීමට යෝජනා කෙරේ.ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබීය.

I. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය වෙනස්වීම් හේතුවෙන් ඉදිකරමින් පැවති කොළඹ වරාය නගර ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘති සමාගම විසින් ඇ.ඩොලර් මිලියන 143 ක වන්දි මුදල ඉල්ලුම් කර තිබූ නමුත් පසුව ඇති කර ගෙන තිබුණු එකගතාවයක් මත ශ්‍රී ලංකා රජය සතු වාණිජමය ඉඩම් කොටසින් හෙක්ටයාර් 2 ක ප්‍රමාණයක් ව්‍යාපෘති සමාගම වෙත ලබා දීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට අලාභයක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

II. ත්‍රෛපාර්ශවීය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ මායිම දක්වා වූ යටිතල පහසුකම් සැපයීම ශ්‍රී ලංකා රජය විසින් වගකීම දැරිය යුතු අතර ඒ වෙනුවෙන් අවශ්‍ය අපේක්ෂිත මුදල ඇ.ඩොලර් බිලියන 1කි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබීය.

(i) වරාය නගරයේ අපජලය කළමනාකරණය සඳහා ස්ථිර විසඳුමක් සපයන තුරු තාවකාලික විසඳුමක අවශ්‍යතාවය කොළඹ නගර සභාව විසින් දන්වා තිබුණු අතර ඒ සඳහා අපේක්ෂිත වියදම රු. මිලියන 1000 ක් ලෙස පළමුව ඇස්තමේන්තු කර තිබුණද සැලසුම් කිරීමේ හා මිල ඉහළ යාම් හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 3700 ක් වී තිබුණි. මෙම කාර්යය 2019 වන විට අවසන් විය යුතු බවටත් යෝජනා වී තිබුණද කොවිඩ් ව්‍යාප්තිය සහ ගෝලීය ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබුණේ 2022 දෙසැම්බර් මසයේ වන අතර ඒ අනුව, අපජලය කළමනාකරණය සඳහා තාවකාලික විසඳුම සම්පූර්ණ කිරීම වෙනුවෙන් 2017, 2018 සහ 2019 වර්ෂ වලදී රු. මිලියන 1600 ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් වෙන් කර මුදා හැරීමට කටයුතු කලද 2023 සැප්තැම්බර් 31 දින වන විටත් මෙම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

(ii) එසේම, රු. මිලියන 2900 ක මුළු පිරිවැයකට ඇස්තමේන්තු ගත කර තිබුණු ස්ථිර විසඳුමේ කාර්යයන්ද 2022 වර්ෂය අවසානයේදී සම්පූර්ණ කළ යුතු වුවද 2023 සැප්තැම්බර් 31 දින වන විටත් මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි.

(iii) තවද 2017 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණු තාවකාලික විසඳුම සඳහා වෙන්කල රු. මිලියන 1600 මුදල, 2022 වර්ෂයේ අවසන් කිරීමට යෝජිත ස්ථිර විසඳුම සඳහා වෙන් කල මුදල වූ රු. මිලියන 2900 න් සියයට 55 ක් වන අතර මෙම ව්‍යාපෘති දෙක අවසන් කිරීමට නියමිත කාල සීමාවන් අතර

වෙනස වර්ෂ 3 ක් වුවද ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා රජයට තාවකාලික විසඳුම වෙනුවෙන් රු. මිලියන 1600ක් දැරිය යුතු විය.

III. ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි 24.1.2 ඡේදය ප්‍රකාරව, හෙක්ටයාර් 91 ක් වූ පොදු ඉඩම් ප්‍රමාණය ශ්‍රී ලංකා රජය සතු විය යුතු අතර මෙම කොන්දේසිය අනුව වරාය නගරයේ මුහුදු වෙරළ ප්‍රදේශය ශ්‍රී ලංකා රජය සතු විය යුතු වුවත් ව්‍යාපෘති සමාගම විසින් මුහුදු වෙරළ ප්‍රදේශයට අයත් ඉඩම් අවන්හල් කිහිපයකට තාවකාලිකව කුලියට දීමට කටයුතු කර එම අවන්හල්වලින් අදාළ ආදායම් එකතු කර ගෙන තිබුණි.

IV. ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි උපලේඛන අංක 10 අනුව, වාණිජමය ඉඩම්, පොදු ඉඩම් සහ මාර්ග සඳහා වූ ඉඩම් ඇතුලුව ඉඩම් කොටස් 118 ක වැඩබිම් වැඩි දියුණු කිරීම 2019 සැප්තැම්බර් 16 දින වන විට අවසන් කළ යුතු වුවත් 2023 සැප්තැම්බර් 30 දින වන විට ඉඩම් කොටස් 85කට පමණක් අවසන් කිරීමේ සහතික ලබා දී තිබුණු අතර ඉඩම් කොටස් 33 කට අවසන් කිරීමේ සහතික ලබා දී නොතිබුණි.

V. ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි උපලේඛන අංක 10 අනුව, මාර්ග සහ පාලම් 2020 මාර්තු 14 දින වන විට අවසන් කළ යුතු වුවද, 2023 සැප්තැම්බර් 30 දින වන විට මාර්ග සහ පදික වේදිකාවේ වැඩ සියයට 63 කුත්, වාහන සඳහා වූ පාලම් සඳහා සමස්තයක් ලෙස සියයට 80කට වැඩි ප්‍රතිශතයකිනුත්, උමං මාර්ග වැඩ සියයට 90 කට වැඩි ප්‍රතිශතයකිනුත් මගී පාලම් සියයට 74 කට වඩා වැඩි ප්‍රතිශතයකිනුත් ප්‍රගතියක් පෙන්නුම් කළද නියමිත දිනට ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

VI. ත්‍රෛපාර්ශ්වික ගිවිසුමේ අංක 10 දරන උපලේඛනය අනුව, භූමි අලංකරණ කටයුතු අදියර 01, 2020 මාර්තු 09 අවසන් කළ යුතුවේ. 2023 නොවැම්බර් 30 දිනට භූමි අලංකරණ කටයුතුවල ප්‍රගතිය 77% කි.

VII. දකුණු මලාපවාහන මාර්ගය නිම කිරීමට මුල් සැලසුම් කළ දිනය 2023 ජූලි 11 වුවද එය 2023 සැප්තැම්බර් 30 වන විටද නිම කිරීමට අපොහොසත් වී ඇත. මෙම මාර්ගය අදියර 7කින් නිමකිරීමට සැළසුම් ඇති අතර ඉන් අදියර තුනක්ම සැළසුම් අදියරේ පැවතුනි.

VIII. ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව වෙන් කිරීමට නියමිත ඉඩම් සහ සත්‍ය වශයෙන් වෙන් කල ඉඩම් අතර පහත පරිදි වෙනස්කම් නිරීක්ෂණය විය.

| | සත්‍ය වෙන් කිරීම (හෙක්ටයාර්) (ඉදිරිපත් කළ උපලේඛනය අනුව) | ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව වෙන් කිරීම (හෙක්ටයාර්) | වෙනස (හෙක්ටයාර්) |
|---|---|---|---|
| පොදු ඉඩම | 93.65 | 91 | 2.65 |
| අලෙවි කළ හැකි ඉඩම් (GOSL) | 60.85 | 62 | (1.15) |
| අලෙවි කළ හැකි ඉඩම් (ව්‍යාපෘති සමාගම) | 118.16 | 116 | 2.16 |

(ආ) 2021 අයවැය මගින් ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්ට ඉහළ ආදායම් ලබන රැකියා උත්පාදනය කිරීම සහ විදේශ විනිමය ඉපයීම දිරිගැන්වීම සඳහා තාක්ෂණ ව්‍යවසායන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගාල්ල, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර සහ මඩකලපුව යන ප්‍රදේශවල තාක්ෂණික උද්‍යාන 5ක් ඉතා කඩිනමින් පිහිටුවීමට යෝජනා කර ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබීය.

**I. ටෙක්නෝ පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම පිහිටුවීම**

(i) සංගමික ව්‍යවස්ථාවලියෙහි 27 (2) වගන්තිවලට අනුව, අධ්‍යක්ෂවරයෙකුගේ කාර්යාලයක පුරප්පාඩුවක් ඇති වුවහොත්, පුරප්පාඩුව ඇති වූ දින සිට දින 07 ක් ඇතුළත ආදේශක අධ්‍යක්ෂවරයෙකු නම් කිරීමට රන් කොටස් හිමියාට (golden Shareholder) හිමිකම් ඇත. කෙසේවෙතත් සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) සංගමික ව්‍යවස්ථාවලියෙහි 43(1)(iii)&(iv) සහ 43(2) වගන්ති ප්‍රකාරව සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද ,සංගමික ව්‍යවස්ථාවලියෙහි 43(5) වගන්ති ප්‍රකාරව වාර්ෂික වාර්තා පිළියෙළ කර නොතිබුණි.

II. තාක්ෂණික උද්‍යානය ගාල්ල ඉදිකිරීම් සම්බන්දයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2021 අප්‍රේල් 08 දිනැති ජනාධිපති ලේකම්වරයාගේ ලිපියට අනුව ගාලු තාක්ෂණික උද්‍යානය සඳහා වලහන්දූව වත්ත, අක්මීමන ඉඩමෙන් අක්කර 31 රූඩ් 2 පර්චස් 23 ක ප්‍රමාණයක් ලබා ගන්නා ලෙස දන්වා තිබුණද, මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගෙන තිබුණේ අක්කර 29 රූඩ් 03 7.15 ක ඉඩම් කොටසක් පමණි.

(ii) මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය ගාල්ලේ තාක්ෂණික උද්‍යාන ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු උපදේශකයෙකු ලෙස පත් කර ඇත. 2022 මාර්තු 28 දිනැති ගිවිසුමට සහ 2022.01.19 දිනැති පත්වීම් ලිපිය අනුව ගෙවිය යුතු උපදේශන ගාස්තුව ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත්තු මුදලින් 1.25% + වැට් බද්ද වශයෙන් විය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් තත්ත්ව වාර්තාව (Status Report ) අනුව මුළු මුදල රු. 18,173,751 ක් 2022.04 මස සිට හිඟ විය.

(iii) කොන්ත්‍රාත්තු ගිවිසුමෙහි 14.5 උප වගන්තියට අනුව, එක් එක් අතුරු ගෙවීම් සහතිකය තුළ සහතික කර ඇති මුදල සමාගම විසින් කොන්ත්රාත්කරුට ඉංජිනේරුවරයාගේ සහතිකයෙන් දින 28 ක් ඇතුළත ගෙවිය යුතුය. කෙසේ වෙතත්, විගණන දිනය වන විට සහ වසර 2 කට ආසන්න කාලයක් ගත වුවද මාගා ඉංජිනියරින්ග් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනයෙහි අංක 509M (0101) දරණ සහ 2024 අප්‍රේල් 02 දිනැති ලිපිය අනුව සමාගම කොන්ත්‍රාත්කරුට 2024 මාර්තු 31 දිනට රුපියල් 950,601,926 ක මුදලක් ගෙවීමට තිබුණි.

(iv) කොන්ත්‍රාත් ගිවිසුමෙහි වගන්ති 14.6 ප්‍රකාරව අතුරු ගෙවීම් සහතිකය අනුව ගෙවිය යුතු ගෙවීම් ප්‍රමාද කිරීම සඳහා ප්‍රමාද පොළී කොන්ත්‍රාත්කරුට අයකළ හැකි අතර, මාගා ඉංජිනියරින්ග් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනයෙහි අංක 509M (0101) දරණ සහ 2024 අප්‍රේල් 02 දිනැති ලිපිය අනුව 2024 මාර්තු 31 දිනට ප්‍රමාද ගෙවීම් සඳහා පොළිය රු.236,355,010 කි.

(v) 2024 පෙබරවාරි 05 දින සිදු කරන ලද භෞතිකව පරික්ෂාවේදී 2021 වසරේ ආරම්භ කර වසර 2ක් ගතවුවද ඉදිකිරීම් කටයුතු මූලික අදියරේ එනම් ගොඩනැගිලි පදනම් මට්ටමේදී ඉදිකිරීම් කටයුතු නවතා දමා පැවති බව නිරීක්ෂණය විය.

**III. තාක්ෂණික උද්‍යානය කුරුණෑගල ඉදිකිරීම් සම්බන්දයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

(i) 2021 ජූනි 17 වැනි දින ජනාධිපති කාර්යාලයෙන් නිකුත් කළ ලිපියට අනුව නව ආයෝජන සඳහා රජයේ ඉඩම් අක්කර 50ක් ලබාදෙන බව දන්වා තිබුණද ඉදිකිරීම් සඳහා ලබා ගෙන තිබුණේ මගුරුඔයවත්ත, රත්ගල්ල ඉඩමෙන් අක්කර 20ක පමණ ඉඩම් ප්‍රමාණයක් පමණි. තවද මෙම ඉඩමෙහි පිහිටාතිබෙන නිවාස 2 සඳහා විකල්ප ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් පියවර ගන්නා ලද බව විගණනයට නිරීක්ෂණය නොවිය.

(ii) මූලික කොන්ත්‍රාත්තු මිල රු.7,312,017,333 ( VAT රහිත) වුවද 2023 දෙසැම්බර් තත්ත්ව වාර්තාව (Status Report ) අනුව ප්‍රමාද ගෙවීම් රු.416,802,172 කි. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම ප්‍රමාදවීම හේතුවෙන් දැනටමත් මූලික පිරිවැය ඇස්තමේන්තුවට වඩා රු. 416,802,172 ක් පිරිවැය වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය. තවද, මෙම වැඩිවන වියදම් සඳහා අරමුදල් සපයා ගන්නා ක්‍රමයක් සැළසුම් කර නොතිබුණි.

(iii) මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය කුරුණෑගල තාක්ෂණික උද්‍යාන ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු උපදේශකයෙකු ලෙස පත් කර ඇත. 2022 මාර්තු 28 දිනැති ගිවිසුමට සහ 2022.01.19 දිනැති පත්වීම් ලිපිය අනුව ගෙවිය යුතු උපදේශන ගාස්තුව ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත්තු මුදලින් 1.25% + වැට් බද්ද වශයෙන් විය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් තත්ත්ව වාර්තාව (Status Report ) අනුව එම ආයතනයට ගෙවිය යුතු මුදල රු.36,188,088ක් විය.

(iv) 2024 පෙබරවාරි 09 දින සිදු කරන ලද භෞතිකව පරික්ෂාවේදී 2021 වසරේ ආරම්භ කර වසර 2ක් ගතවුවද ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ නොකර අතරමැදදී නවතා දමා තිබූ බව නිරීක්ෂණය විය.

